# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

# පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තුව - සහකාර නීති අධ්‍යක්ෂ

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා ඉහත සඳහන් ඇබැර්තු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

බාහිර අපේක්ෂකයන් (පහත 1 හෝ 2 හා 3)

**අධ්‍යාපන :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා තිබීම.
2. නීතිඥයෙකු වීම

**හා**

3. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව ක්‍රියාකාරී වෘත්තීමය/ නීති කටයුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන් (පහත 1 හෝ 2)**

**අධ්‍යාපන**

1. ඉහත සඳහන් (1 හෝ 2 හා 3) පරිදි බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබාතිබීම.

**සේවා පළපුරුද්ද :**

2. තනතුරට අදාළව නීති කටයුතු ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM1-1) තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වේ.

MM 1-1 2016- 53,175-10x1,375-15x1,910-95,575.00 + අනුමත දීමනාවන්.

**වයස් සීමාව:**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**තනතුරට අදාළ පොදු කොන්දේසි :**

- තෝරාගනු ලබන අදුම්කරුවන් තම වැටුපෙන් 10% කින් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. කාර්යාංශය සේවක අර්ථසාධක අරමුදලට (EPF) 15% කින් දායක වන අතර, ඊට අමතරව සේවක භාරකාර අරමුදලට (ETF) 3%කින් දායක වනු ඇත.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් සඳහා හිමිකම් ඇත.
- බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ පහසුකම් සඳහා හිමිකම් ඇත.
- රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම් කළ යුතුයි.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ අයදුම්පත් 2024.01.05 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන),**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**නො. 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**